# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2025 අප්‍රේල් 4 |

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ඉහළ පෙළේ ශ්‍රී ලංකා සංචාරය අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් 2026 මාර්තු මාසයේ දී ආරම්භ වීමට නියමිත අන්‍යෝන්‍ය ඇගයීම පිළිබඳ දැනුවත් කිරීමේ සහ ඒ සඳහා සහාය ලබාදීමේ අරමුණින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ඉහළ පෙළේ නියෝජිත පිරිසක් 2025 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ සූදානම පිළිබඳව එම නියෝජිත පිරිස මෙරට බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වූහ.

1. මිට්සුටෝෂි කජිකාවා මහතා - මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම සභාපති, ජපන් මුදල් අමාත්‍යාංශයේ ජාත්‍යන්තර කටයුතු සඳහා වන නියෝජ්‍ය උප මුදල් අමාත්‍ය
2. මිතලි ත්‍යාගි මහත්මිය - වැඩබලන නියෝජ්‍ය විධායක ලේකම්, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ලේකම් කාර්යාලය
3. ටකහිරෝ යමසාකි මහතා - අධ්‍යක්ෂ, නීති විරෝධී මූල්‍ය ප්‍රවාහ මැඩපැවැත්වීමේ කාර්යාලය, ජාත්‍යන්තර කාර්යාංශය, ජපන් මුදල් අමාත්‍යාංශය, ජපානය

මෙම ජාත්‍යන්තර නියෝජිත පිරිසට ඇතුළත් වූහ.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම යනු මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය මූල්‍යනය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් සිය සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කරන බව සහතික කිරීම සඳහා, මූල්‍ය කාර්ය සාධක බලකාය යටතේ පිහිටුවා ඇති කලාපීය අධීක්ෂණ ආයතනයකි. සියලුම රටවල් විසින් මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සම්බන්ධයෙන් වන අනුකූලතාව මෙන්ම ආසන්නතම ප්‍රතිඵල 11 ක් හරහා ඒවා කෙතරම් සඵලදායිත්වයකින් යුතුව ක්‍රියාත්මක වන්නේ ද යන්න පෙන්නුම් කළ යුතු අතර, එමඟින් මූල්‍ය අපරාධ අවම කිරීමට සහ මූල්‍ය අඛණ්ඩතාව ශක්තිමත් කිරීමට ගන්නා ගෝලීය ප්‍රයත්නයන් ඉහළ නැංවීම බලාපොරොත්තු වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ තෙවන අන්‍යෝන්‍ය ඇගයීම 2026 මාර්තු මාසයේ දී ආරම්භ වීමට නියමිතය. මේ වනවිට, රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් 24 ක්, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් ද මෙරට මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රයත්නයන්හි නියැලී සිටින අතර, මූල්‍ය බුද්ධි ඒකකය මේ සම්බන්ධයෙන් කේන්ද්‍රස්ථානය ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මෙම සංචාරයේ දී, ඉහළ පෙළේ නියෝජිත පිරිස විසින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා හමුවී, ඇගයීම පිළිබඳව ශ්‍රී ලංකාවේ පෙර සූදානම, අභියෝග සහ උපායමාර්ගික ප්‍රමුඛතා පිළිබඳව සාකච්ඡා කළහ. ඉදිරි ඇගයීමට සූදානම් වීම සඳහා මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කිරීම සහ ඊට මඟ පෙන්වීම සඳහා මෙම නියෝජිත පිරිස කැබිනට් අමාත්‍යවරුන් කිහිප දෙනෙකු සහ ඉහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් ඇතුළු අනෙකුත් අදාළ පාර්ශ්වයන් සමඟ ද රැස්වීම් පැවැත්වූහ.